# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# Annual Report
# 2016




ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය - ශ්‍රී ලංකාව

கம்பஹா விக்ரமாராச்சி ஆயுர்வேத நிறுவகம - இலங்கை

Gampaha Wickramarachchi Ayurvede Institute - Sri Lanka

# වාර්ෂික වාර්තාව - 2016

## ஆண்டறிக்கை – 2016

# Annual Report - 2016

## ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය

## කැලණිය විශ්වවිද්‍යාලය

### கம்பஹா விக்கிரமாராச்சி ஆயுர்வேத நிறுவனம்

### களனிப் பல்கலைக்கழகம

Gampaha Wickramarachchi Ayurveda Institute

University of Kelaniya

# වාර්ෂික වාර්තාව - 2016

## ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය

## කැලණිය විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1995 මාර්තු මස 13 වන දින ප්‍රකාශයට පත් කරන ලද අංක 862/8 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 අ (2) හා 24 (ආ) යටතේ 1995 අංක 01 දරණ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතන නියමාවලිය ප්‍රකාශයට පත්කර තිබේ. එමගින් ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස පිහිටුවා ඇත.

එකී නියමාවලියේ ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී යන අධ්‍යයන වර්ෂ පහකින් සමන්විත උපාධි පාඨමාලාවක් පවත්වාගෙන යාම ප්‍රධාන පරමාර්ථය වී ඇත.

ඒ අනුව 1995 මාර්තු මස 01 වන දින සිට උසස් අධ්‍යාපන ආයතනයක් වශයෙන් පවත්වා ගෙන යන මෙම ආයතනයේ 2016 වර්ෂය සඳහා වූ ආයතනික කටයුතු හා සංවර්ධනය ඇතුළත් වාර්ෂික වාර්තාව, අවසාන ගිණුම් වාර්තාව හා 2016 වර්ෂය සඳහා මෙම ආයතනය සම්බන්ධයෙන් වූ රජයේ විගණකාධිපති විසින් ලබා දී ඇති වාර්තාව මෙයින් ඉදිරිපත් කරමි.

මහාචාර්ය ජයන්ත වැලිහිඳ

නිසි බලධාරී

# ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය

## නිසි බලධාරීවරයාගේ වාර්තාව

ආයතනයේ දැක්ම හා මෙහෙවර ළඟා කර ගැනීමට සකස් කරන ලද 2013 - 2017 දක්වා වන සංයුක්ත සැලැස්ම 2013.07.19 වන දින පැවැති මෙම ආයතනයේ 206 වන කළමනාකරණ මණ්ඩලයේ දී අනුමත කර තිබේ.

ඒ අනුව උපාධි අපේක්ෂක සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය අගය කළයුතු මට්ටමකට ළඟා කර ගැනීමට හැකි වූ බව සතුටින් සඳහන් කරමු.

සංයුක්ත සැලැස්මේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී නොවැලැක්විය හැකි හේතූන් හා අනපේක්ෂිත බාධාවන් නිසා ඇතැම් ඉලක්ක ළඟා කර ගැනීමට අපොහොසත් වූ බව කිව යුතුය.

සංයුක්ත සැලැස්ම සංශෝධනය කර එමගින් සංයුක්ත සැලැස්මේ සඳහන් ඉලක්ක යම් ප්‍රමාණයකින් ළඟා කරගත හැකි වේ යයි මාගේ විශ්වාසය යි.

මහාචාර්ය ජයන්ත වැලිහිඳ
නිසි බලධාරී

# පටුන


| කාරණය | | පිටු අංක |
|---|---|---|
| 01 | ආයතනයේ දැක්ම | 01 |
| 02 | මෙහෙවර ප්‍රකාශය | 02 |
| 03 | නිසි බලධාරීවරයාගේ සමාලෝචනය - 2016 | 03 - 06 |
| 04 | 2016 වර්ෂය තුළ විද්‍යායතනයේ පැවැති රැස්වීම් පිළිබඳ තොරතුරු | 06 |
| 05 | කාර්ය මණ්ඩල හා ශිෂ්‍යයන් පිළිබඳ විස්තර | 06 |
| 06 | දේශීය සිසුන් පිළිබඳ විස්තර (2016.12.31 දිනට ) | 06 |
| 07 | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර | 07 |
| 08 | අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර | 08 |
| 09 | පර්යේෂණ, නව සොයා ගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර | 09 |
| 10 | විද්‍යායතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සහභාගී වූ වැඩ සටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර | 09 |
| 11 | විද්‍යායතනය මගින් පවත්වනු ලැබූ පශ්චාත් උපාධි, ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා විස්තර | 10 |
| 12 | පුනරාවර්තන වියදම් විස්තර | 10 |
| 13 | ප්‍රාග්ධන වියදම් විස්තර | 10 |
| 14 | පර්යේෂණ ව්‍යාපෘති සඳහා ආධාර ලැබීම් සහ උපයෝජන | 11 |
| 15 | මූල්‍ය තත්ත්වයේ ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්) | 11 |
| 16 | මූල්‍ය තත්ත්වයේ ප්‍රගතිය පිළිබඳ විස්තර (අභ්‍යන්තර ආදායම්) | 11 |
| 17 | මූල්‍ය ක්‍රියාකාරීත්ව විශ්ලේෂණය -2016 | 12 |
| 18 | යටිතල පහසුකම් සඳහා 2016 තුළ ලැබීම් | 12 |
| 19 | වෙනත් විස්තර | 12 -13 |
| | 19.1 පුස්තකාලය | |
| 20 | මූල්‍ය කටයුතු පිළිබඳ නිසි බලධාරී වාර්තාව | 14-15 |
| 21 | 2016.12.31 වන දිනට මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශය | 16 |

| | | |
|---|---|---|
| 22 | 2016.12.31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශය | 17 |
| 23 | විගණකාධිපති වාර්තාව | 18-27 |
| 24 | විගණකාධිපති වාර්තාවට පිළිතුරු | 28-32 |

## 1. ආයතනයේ දැක්ම

**දැක්ම**

කුසලතා පූර්ණ උපාධිධාරීන් බිහි කිරීම මගින්
ආයුර්වේද අධ්‍යයන පිළිබඳ විශිෂ්ට
මධ්‍යස්ථානය බවට පත්වීම

## 2. මෙහෙවර ප්‍රකාශය

### මෙහෙවර

"මෙම ආයතනයේ අධ්‍යාපනය ලබන සිසුන් හැම අතින්ම සංවර්ධනය කිරීම සඳහා සුදුසු වාතාවරණයක් බිහි කිරීම, ආයුර්වේද වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රායෝගික සහ පර්යේෂණ දියුණු කිරීම සඳහා සුදුසු පරිසරයක් ගොඩනැගීම, ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අවශ්‍යතාවන්ට සරිලන නවීන ඉගැන්වීම් සහ පුහුණුවීම් තුළින් දැනුම ළඟා කර ගැනීම පිණිස ප්‍රායෝගික පුහුණුවීම්වලට පදනම් වන පරිසරයක් ගොඩනැගීම, පවත්නා ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධි පාඨමාලාවේ ව්‍යුහාත්මක වෙනසක් ඇති කරමින් ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ දැමීම සඳහා සැලසුම් සකස් කිරීම, ශ්‍රී ලංකාවේ සහ දේශයෙන් පිටත සෞඛ්‍ය ක්ෂේත්‍ර සම්බන්ධ කටයුතුවල නියැලී සිටින ආයතන සමඟ අන්තර් සම්බන්ධතාවන් ගොඩනැංවීම, අවශ්‍ය සුදුසුකම් හා උනන්දුවක් සහිත මානව සම්පත් කණ්ඩායමක් ආයතනය තුළ බිහි කිරීම"

## 3. නිසි බලධාරීවරයාගේ සමාලෝචනය - 2016

### අ. සංක්ෂිප්ත හැඳින්වීම

**පිහිටීම**

මෙම ආයතනය කොළඹට කි.මී. 30 පමණ උතුරින් කොළඹ - නුවර පාරේ යක්කල නගරය ආසන්නයේ පිහිටා ඇත.

**ආරම්භය**

සියනෑ කොරළයේ ප්‍රසිද්ධ වෙද පරපුරක් වූ නැඳුන්ගමුවේ වෙද පරපුරේ ජන්ම ලාභය ලැබූ ආයුර්වේද චක්‍රවර්තී, පණ්ඩිත ජී.පී. වික්‍රමාරච්චි මැතිඳුන් විසින් ශ්‍රී ලංකාව තුළ පාරම්පරික ව පැවත ආ වට්ටෝරු වෙදකම ක්‍රියාත්මක ව පැවති යුගයක ගම්පහ ආයුර්වේද වෛද්‍ය සංගමයේ ආරාධනය පරිදි ආයුර්වේද වෛද්‍ය සිසුන්ට ඖෂධ පරිඥානය, ඖෂධ සංස්කරණය, රෝග-රෝගී පරීක්ෂණය සහ චිකිත්සා සංවිධානය යන අංශ පිළිබඳ ව ක්‍රමානුකූල ව පුහුණු කොට දැනුමට නිසි කර්මාභ්‍යාසයක් ලබා දෙන ආයතනයක අවශ්‍යතාව සපුරාලීමේ අරමුණින් වර්ෂ 1929 ජූලි මස 19 වැනි දින ශුභ මොහොතින් "ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය" යන නමින් මෙම ආයතනය ආරම්භ කරන ලදී.

භාරතයේ කල්කටා අෂ්ටාංග ආයුර්වේද විද්‍යාලයේ අධ්‍යාපනය ලබා එල්.ඒ.එම්.එස්. උපාධිය ලත් එතුමා භාරතයෙන් ලද අධ්‍යාපන ක්‍රමවේදයත්, පරම්පරානුගත දේශීය වෛද්‍ය ඥානයත් එකට සංකලනය කොට ආයුර්වේද මූලධර්මවලට අනුකූල වන අයුරින් න්‍යායික හා ප්‍රායෝගික අංශ ඇතුළත් පස් අවුරුදු පාඨමාලාවක් සකස් කොට එය සාර්ථක ව ක්‍රියාත්මක කිරීම සඳහා මූලික අවශ්‍යතාවන් වූ දුර්ලභ ඖෂධයන්ගෙන් සමන්විත "ඔසු උයනක්", "ඖෂධ නිෂ්පාදනාගාරයක්" සහ රෝගීන්ට නොමිලයේ ඖෂධ ලබා දීම සඳහා "දාතව්‍ය චිකිත්සාගාරයක්" ද තම පෞද්ගලික ධනය යොදා ආරම්භ කළේ ය. ආයතනයේ ප්‍රථම ආචාර්ය මණ්ඩලය අධ්‍යක්ෂතුමා ඇතුළු දහතුන් දෙනෙකුගෙන් සමන්විත විය. මේ අය අතර ආයුර්වේද හිතකාමී භාරතීය උපාධි ලත් වෛද්‍යවරු, සුප්‍රකට පාරම්පරික වෛද්‍යවරු සහ ආයුර්වේදයට සම්බන්ධ වෙනත් විෂයයන් පිළිබඳ උගත්තු ද වූහ. ආරම්භක විද්‍යාර්ථීන් සංඛ්‍යාව 20 ක් වූ අතර ඔවුනට අධ්‍යාපන කටයුතු, නේවාසික පහසුකම් හා වෙනත් අවශ්‍ය උපකරණ ආදිය ද නොමිලයේ ම සපයන ලදී.

වසර 5ක් න්‍යායික සහ ප්‍රායෝගික පුහුණුව සහිත ව අධ්‍යාපනය ලබා ලිඛිත, ප්‍රායෝගික සහ වාචික පරීක්ෂණවලින් උත්තීර්ණ වූ විද්‍යාර්ථීන්ට සිද්ධායුර්වේදඥ (ඩී.එස්.ඒ.සී.) අභිඥාන පත්‍රය පිරිනමන ලදී. ආයතනයේ ප්‍රථම අභිඥානපත්‍ර ප්‍රදානෝත්සවය සිදු කරන ලද්දේ වර්ෂ 1934 දී ය.

**රජයේ පිළිගැනීම**

ආයතනය තුළින් සිදු වෙමින් පැවති විශිෂ්ට සේවාව පිළිබඳ ව සලකා බැලූ රජය විසින් වර්ෂ 1951 ජූලි 13, අංක 10270 දරන ගැසට් නිවේදනය මගින් ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය රජය පිළිගත් ආයතනයක් බවට පත් කරන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් විද්‍යාලයීය ඩිප්ලෝමාධාරී වෛද්‍යවරුන්ට රජයේ හා පළාත් පාලන ආයතනවල සේවය සඳහා ඉදිරිපත් වීමේ අවස්ථාවක් සැලසුණි.

වර්ෂ 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ ප්‍රකාර ව ද ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය රජය පිළිගත යුතු ආයතනයක් වශයෙන් ආයුර්වේද වෛද්‍ය සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලදී. වර්ෂ 1966 අගෝස්තු මස 16 වැනි දින විද්‍යාලයේ අනාගත චිරස්ථිතිය ස්ථිර වීම සඳහා

ව්‍යවස්ථානුකූල ව "ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාල පාලක සභාව" ස්ථාපිත කරන ලද අතර එය සාමාජිකවරුන් 11 දෙනෙකුගෙන් සමන්විත විය.

**ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය නමින් සංස්ථාගත වීම**

අභාවප්‍රාප්ත පණ්ඩිත ජී.පී. වික්‍රමාරච්චි මැතිතුමා විසින් ආරම්භ කොට පවත්වාගෙන යන ලද ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය ස්වකීය පරමාර්ථ සාර්ථක ව ඉටු කර ඇති අතර එහි සංවර්ධනය හා අඛණ්ඩ පැවැත්ම සහ මහජන යහපත සඳහා පාලක සභා සාමාජිකයන්ගේ ද එකඟත්වය ඇති ව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උත්තරීතර පාර්ලිමේන්තුව විසින් වර්ෂ 1982 අංක 30 දරන ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය "ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය" යන නාමයෙන් හා අභිධානයෙන් වූ සංස්ථාගත කිරීමේ පනත සම්මත කර ගන්නා ලදී.

ඉන් පසු ව රජයේ පූර්ණ අනුග්‍රහය යටතේ සංස්ථාවේ පොදු පරමාර්ථ ඉටු වන අයුරින් සංවර්ධන කටයුතු සිදු විය. අධ්‍යයන අංශ පිහිටුවීම, රෝහල් සංකීර්ණය පිහිටුවීම, දේශන ශාලා ඉදිවීම, පුස්තකාලය පිහිටුවීම, විද්‍යාගාර සකස් වීම ආදිය ඉන් සමහරකි.

**විශ්වවිද්‍යාලයීය ආයතනයක් බවට පත් වීම**

රාජ්‍ය අනුග්‍රහය ලබමින් සිදු කරන ලද සේවය සහ ආයතනයේ ඉදිරි අනාගතය පිළිබඳ ව සලකා බැලූ රජය අතිවිශේෂ ගැසට් නිවේදනයක් මගින් 1995 මාර්තු මස 01 වන දින සිට "කැලණිය විශ්වවිද්‍යාලයීය ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය" නමින් විශ්වවිද්‍යාලයීය ආයතනයක් බවට පත් කරන ලදී.

අනතුරු ව 1997 වසරේ දී අධ්‍යයන වර්ෂ පහකින් සමන්විත බී.ඒ.එම්.එස්. උපාධි පාඨමාලාව සඳහා ප්‍රථම වරට සිසුන් බඳවා ගන්නා ලදී. වර්තමානය වනවිට මෙම ආයුර්වේද විද්‍යායතනය පහත සඳහන් අධ්‍යයනාංශ වලින් සමන්විත වේ.

1 මූලධර්ම අධ්‍යයනාංශය
2 කෞමාරභෘත්‍ය හා ස්ත්‍රී රෝග අධ්‍යයනාංශය
3 ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයනාංශය
4 චිකිත්සා අධ්‍යයනාංශය
5 ශල්‍ය ශාලාක්‍ය අධ්‍යයනාංශය

**විද්‍යායතනයේ කළමණාකරන මණ්ඩලයේ සංයුතිය:**

නිසිබලධාරී
මහාචාර්ය ජයන්ත වැලිහිඳ මහතා 2015.05.08 - 2018.05.07

පී.එම්.ආර්.ඩී. අපොන්සු මහතා 2015.05.08 - 2018.05.07
අධ්‍යක්ෂ (සැලසුම්)/උ. අ. අ

කේ.ඩබ්.පී. දයාරත්න මිය 2015.05.08 - 2018.05.07
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර මහතා 2015.05.08 - 2018.05.07
ලේකම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

වෛද්‍ය ජේ.ටී.ආර් ජයකොඩි මහතා 2015.05.08 - 2018.05.07
අංශ ප්‍රධාන, ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය

| | |
|---|---|
| ආචාර්ය වෛද්‍ය වසන්තා වික්‍රමාරච්චි මහත්මිය<br>අංශ ප්‍රධාන චිකිත්සා අධ්‍යයන අංශය | 2015.05.08 - 2018.05.07 |
| වෛද්‍ය ජේ.කේ.ඒ. ජයකොඩි මහත්මිය<br>අධ්‍යක්ෂ වික්‍රමාරච්චි ආයුර්වේද රෝහල | 2015.05.08 - 2018.05.07 |
| මහාචාර්ය එන්.ආර් ද සිල්වා මහත්මිය<br>වෛද්‍ය පීඨාධිපති, රාගම වෛද්‍ය පීඨය | 2015.05.08 - 2018.05.07 |
| වෛද්‍ය බැසිල් රංජිත් ප්‍රනාන්දු මහතා<br>ආයුර්වේද වෛද්‍ය සභාව | 2015.05.08 - 2018.05.07 |
| මහාචාර්ය එල්.ආර්. ජයසේකර මහතා<br>ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, උද්භිද විද්‍යා අංශය,<br>කැලණිය විශ්වවිද්‍යාලය | 2015.05.08 - 2018.05.07 |
| වෛද්‍ය බුද්ධික ලියනගේ මහතා | 2015.05.08 - 2018.05.07 |
| වෛද්‍ය කේ.ඒ.එන්.පී. බානගල මහතා | 2015.05.08 - 2018.05.07 |
| විනයකාන්ත වික්‍රමාරච්චි මහතා | 2015.05.08 - 2018.05.07 |
| එම්.එම්.එන්.ඩී. බණ්ඩාර මහතා | 2015.05.08 - 2018.05.07 |
| වෛද්‍ය ආර්.ඒ.එල්. රණවීර මහතා | 2015.05.08 - 2018.05.07 |
| ආර්.කේ.ඒ.එල්. රණවීර මහතා | 2015.05.08 - 2018.05.07 |
| චූලා බණ්ඩාර මහතා | 2015.05.08 - 2018.05.07 |
| වෛද්‍ය ජී.එස්.කේ. ධර්මරත්න මහතා | 2015.05.08 - 2018.05.07 |
| වෛද්‍ය තුසිත බණ්ඩාර ඖෂධරත්න මහතා | 2015.05.08 - 2018.05.07 |

ඩබ්ලිව්.ඒ.ඩී. චිත්‍රානන්ද
කළමණාකරණ මණ්ඩලයේ ලේකම්

ආයතනයේ දැක්ම හා මෙහෙවර ළඟාකර ගැනීමට සකස් කරන ලද 2013- 2017 දක්වා වන සංයුක්ත සැලැස්ම 2013.07.19 වන දින පැවැති විද්‍යායතනයේ 206 වන කළමනාකරණ මණ්ඩලය මගින් අනුමත කර තිබේ.

**ආ. ජයග්‍රහණ**

උපාධි අපේක්ෂක සිසුන්ගේ සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය අගය කළ යුතු මට්ටමකට ළඟාකර ගැනීමට හැකි වූ බව සතුටින් සඳහන් කරමු.

**ඇ. අනාගත සැලසුම්**

සංයුක්ත සැලැස්ම සංශෝධනය කරනු ලැබූ අතර එමගින් සංයුක්ත සැලැස්මේ සඳහන් ඉලක්ක යම් ප්‍රමාණයකින් ඉදිරි වර්ෂයේ දී ළඟා කරගත හැකි වේ යයි මාගේ විශ්වාසයයි.

ආයතනය වටා ඇති මුඩු බිම් අත්පත්කර ගැනීමේ කටයුතු කරගෙන යනු ලබන අතර එම ඉඩම් දැනට ගැසට් කර ඇත. මීට අමතරව ආයතනය සඳහා නව ගොඩනැගිලි ඉදිකිරීමටද ඉදිරි වසර කීපය තුළ බලාපොරොත්තු වෙමි.

තවද, ආයතනයේ මානව සම්පත ඉහළ නැංවීමට සහ ආයුර්වේදය සම්බන්ධ පර්යේෂණ කටයුතු දියුණු කිරීමට ද අපේක්ෂා කරමි.

## 4. 2016 වර්ෂය තුළ විද්‍යායතනයේ පැවැති රැස්වීම් පිළිබඳ තොරතුරු:

| අංක | රැස්වීමේ නම | රැස්වීම් වාර ගණන |
|---|---|---|
| 01. | කළමණාකරන මණ්ඩල | 11 |
| 02. | අධ්‍යයන මණ්ඩල | 11 |
| 03. | මුදල් කමිටු | 07 |
| 04. | විගණන කමිටු | 04 |

## 5. කාර්ය මණ්ඩල හා ශිෂ්‍යයන් පිළිබඳ විස්තර -

| පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව **2016.12.31** දිනට | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය | | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | අනුමත | සත්‍ය | අනුමත | සත්‍ය |
| ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය (බී.ඒ.එම්.එස්.) | 389 | 66 | 55 | 110 | 92 |

## 6. දේශීය සිසුන් පිළිබඳ විස්තර (2016.12.31 දිනට) :

(i) වාර්ෂික අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව - 120

(ii) වර්තමාන ශිෂ්‍ය සංඛ්‍යාව:

| පාඨමාලාව | මාධ්‍යය | 1 වන වසර | 2 වන වසර | 3 වන වසර | 4 වන වසර | 5 වන වසර | මුළු ගණන | උපාධියට සුදුසුකම්ලත් ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|---|
| ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය | ඉංග්‍රීසි | 71 | 85 | 72 | 81 | 80 | 389 | 86 |

## 7. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර

| අධ්‍යයන අංශය | විෂයය | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්යය | මහාචාර්යය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | සහකර කථිකාචාර්ය | උපදේශකවරුන් |
|---|---|---|---|---|---|---|---|---|
| මූලධර්ම අධ්‍යයනාංශය | ජ්‍යෝතිෂ්‍ය මූලධර්ම | ඉංග්‍රීසි | | | 02 | 02 | 03 | 04 |
| | භූත විද්‍යාව | | | | 03 | 01 | 03 | 01 |
| කෞමාර භෘත්‍ය හා ස්ත්‍රී රෝග අධ්‍යයනාංශය | ස්ත්‍රී රෝග<br>බාල රෝග<br>ප්‍රසූති තන්ත්‍ර | සිංහල/<br>ඉංග්‍රීසි | | | 02 | 01 | ආධුනික 02 | |
| ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයනාංශය | ද්‍රව්‍යගුණ විඥාන | සිංහල / ඉංග්‍රීසි | | | 04 | | 01 | තාවකාලික කථිකාචාර්ය 02<br>ප්‍රදර්ශක 02 |
| | රස ශාස්ත්‍රය | සිංහල / ඉංග්‍රීසි | | | 02 | | | |
| | භෛසජ්‍ය කල්පනා | සිංහල / ඉංග්‍රීසි | | | 02 | | | |
| | ඖෂධ පැල වගාව | සිංහල / ඉංග්‍රීසි | | | | | 01 | |
| | විශ්ලේෂක රසායන විද්‍යාව | ඉංග්‍රීසි | | | | | | |
| | ශාක රසායන හා ස්වාභාවික නිෂ්පාදන | ඉංග්‍රීසි | | | | | | |
| චිකිත්සා අධ්‍යයනාංශය | කාය චිකිත්සා<br>කාය චිකිත්සා / රෝග විඥාන<br>අගද තන්ත්‍ර<br>ස්වස්ථ<br>ස්වස්ථවෘත | සිංහල | | | 05<br>01 | ආධුනික 01<br>ආධුනික 01<br>ආධුනික 01 | | |
| ශල්‍ය ශාලාක්‍ය අධ්‍යයනාංශය | ශල්‍ය තන්ත්‍රය | සිංහල / ඉංග්‍රීසි | | | 01 | 01 | | |
| | ශාලාක්‍ය තන්ත්‍රය | සිංහල / ඉංග්‍රීසි | | | 01 | | | |
| මුළු ගණන | | | | | 23 | 08 | 10 | 09 |

**8. අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර**

| අංශය | විධායක කාර්ය මණ්ඩලය | |
|---|---|---|
| | අනුමත | සත්‍ය |
| අධ්‍යක්ෂ කාර්යාලය | 01 | 01 |
| පාලන අංශය | 02 | 02 |
| විභාග හා ශිෂ්‍ය සුබසාධන | 01 | 01 |
| ගිණුම් අංශය | 02 | 01 |

| අංශය | ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික | මාණ්ඩලික | කණිෂ්ඨ |
|---|---|---|---|
| අධ්‍යක්ෂ කාර්යාලය | - | 02 | 01 |
| පාලන අංශය | 03 | 05 | 02 |
| විභාග හා ශිෂ්‍ය සුබ සාධන | 04 | 03 | 02 |
| ගිණුම් අංශය | 06 | 04 | 02 |
| වෛද්‍ය විද්‍යා තාක්ෂණ අංශය | 01 | 01 | 01 |
| මූලධර්ම අධ්‍යයන අංශය | 01 | 02 | 04 |
| කෞමාර භෘත්‍ය හා ස්ත්‍රීරෝග අධ්‍යයන අංශය | - | 02 | 01 |
| ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය | 01 | 02 | 03 |
| චිකිත්සා අධ්‍යයන අංශය | 02 | 01 | 02 |
| ශල්‍ය ශාලක්‍ය අධ්‍යයන අංශය | 01 | 01 | 02 |
| පරිගණක අංශය | 02 | 01 | 01 |
| පුස්තකාලය | 01 | 02 | 04 |
| පශ්චාත් උපාධි අධ්‍යයන අංශය | - | 01 | 01 |
| නඩත්තු අංශය | 01 | 03 | 10 |
| **මුළු ගණන** | **23** | **30** | **35** |

## 9. පර්යේෂණ, නව සොයා ගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

| විෂය | අංශය | ප්‍රකාශන ගණන | ඉදිරිපත් කිරීම |
|---|---|---|---|
| අ. පර්යේෂණ ගණන | මූලධර්ම අධ්‍යයන අංශය | 07 | 07 |
| | කෞමාර භෘත්‍ය හා ස්ත්‍රීරෝග අධ්‍යයන අංශය | 27 | |
| | ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය | 11 | 10 |
| | චිකිත්සා අධ්‍යයන අංශය | 30 | 30 |
| | ශල්‍ය ශාලක්‍ය අධ්‍යයන අංශය | 05 | 06 |
| ආ. නවසොයා ගැනීම් | කෞමාර භෘත්‍ය හා ස්ත්‍රීරෝග අධ්‍යයන අංශය | | 01 |
| ඇ. පොත් ගණන | මූලධර්ම අධ්‍යයන අංශය | 08 | |
| | කෞමාර භෘත්‍ය හා ස්ත්‍රීරෝග අධ්‍යයන අංශය | 01 | |
| **මුළු ගණන** | | **89** | **54** |

## 10. විද්‍යායතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සහභාගී වූ වැඩ සටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර

| අධ්‍යයන අංශය | සහභාගී වූ ප්‍රමාණය | | | | |
|---|---|---|---|---|---|
| | පශ්චාත් උපාධි වැඩ සටහන් | පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩ සටහන් | උපාධි වැඩ සටහන් | සහතික පත්‍ර පාඨමාලා වැඩ සටහන් | වෙනත් |
| මූලධර්ම අධ්‍යයන අංශය | 02 | | | 01 | 02 |
| කෞමාර භෘත්‍ය හා ස්ත්‍රී රෝග අධ්‍යයන අංශය | 02 | | | 02 | |
| ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයනාංශය | 02 | | | | 03 |
| චිකිත්සා අධ්‍යයන අංශය | 02 | | | | |
| ශල්‍ය ශාලාක්‍ය අධ්‍යයන අංශය | 01 | | | | |
| **මුළු ගණන** | 09 | | | 03 | 05 |

## 11. විද්‍යායතනය මගින් පවත්වනු ලැබූ පශ්චාත් උපාධි, ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා පිළිබඳ විස්තර

| පාඨමාලාව | ලියාපදිංචි වූ ගණන | සමත් ගණන |
|---|---|---|
| කායචිකිත්සා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 24 | 23 |
| පංචකර්ම පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 26 | 26 |
| යෝග හා සංයම අභ්‍යාස ඩිප්ලෝමාව | 22 | 18 |
| ආයුර්වේද පාමසි ඩිප්ලෝමාව | 30 | 24 |
| සහතික පත්‍ර | 128 | 118 |

## 12. පුනරාවර්තන වියදම් විස්තර

| විෂයය | 2015 | 2016 |
|---|---|---|
| අ. පුද්ගල පඩිනඩි | 168,733,041.00 | 177,610,851.00 |
| ආ. ගමන් වියදම් | 243,893.00 | 1,570,638.00 |
| ඇ. සැපයුම් | 6,245,948.00 | 6,329,846.00 |
| ඈ. නඩත්තු | 2,651,861.00 | 2,810,115.00 |
| ඉ.ගිවිසුම්ගත සේවා / පර්යේෂණ සංවර්ධන | 37,443,516.00 | 35,514,407.00 |
| ඊ.වෙනත් / පාඨමාලා වියදම් | 15,604,190.00 | 14,403,672.00 |
| මුළු ගණන | **230,922,449.00★** | **238,239,529.00** |

★ක්ෂය ප්‍රතිපාදන හැර

## 13. ප්‍රාග්ධන වියදම් විස්තර

| විෂයය | 2015 | 2016 |
|---|---|---|
| පුනරුත්ථාපන හා වැඩි දියුණු කිරීම් | 5,126,851.00 | 8,561,219.00 |
| වත්කම් මිලදී ගැනීම් | 11,038,404.00 | 7,897,825.00 |
| ඉදිකිරීම් | 53,819,856.00 | 28,665,567.00 |
| වෙනත් (ක්‍රමෝපාය සංවර්ධන ) | - | - |
| මුළු ගණන | **69,985,111.00** | **45,124,611.00** |

**14.** පර්යේෂණ ව්‍යාපෘති සඳහා ආධාර ලැබීම් සහ උපයෝජන 2016.12.31 ට

| නම සහ විස්තර | ආධාර දෙන ආයතනය | මුළු මුදල | දරණ ලද මුළු පිරිවැය | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| Dr.W.A.L Chandrasiri | ජාතික උසස් අධ්‍යාපන මධ්‍යස්ථානය | 2,061,450.00 | 1,950,151.28 | 95 |
| Dr.(Mrs.) H.S. Sakunthala | වි.වි.ප්‍ර.කො.ස පර්යේෂණ අරමුදල | 250,000.00 | 250,000.00 | 100 |
| Dr. A.A.J. Pushpakumara | වි.වි.ප්‍ර.කො.ස පර්යේෂණ අරමුදල | 750,000.00 | 604,990.49 | 74 |
| Dr. J.M.P.R.K. Jayasinghe | වි.වි.ප්‍ර.කො.ස පර්යේෂණ අරමුදල | 250,000.00 | 244,380.88 | 98 |
| Dr. Mrs. H.P. Wakkumbura | වි.වි.ප්‍ර.කො.ස පර්යේෂණ අරමුදල | 750,000.00 | 500,000.00 | 67 |
| Mrs. H.A.R.P. Perera | වි.වි.ප්‍ර.කො.ස පර්යේෂණ අරමුදල | 1,720,000.00 | 1,637,889.80 | 95 |

**15.** මූල්‍ය තත්ත්වයේ ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්) -

| විෂයය | 2016 ප්‍රතිපාදන | 2016 වියදම | ඉතිරි / ඉක්මයාම |
|---|---|---|---|
| අ. පුනරාවර්තන | 227,000,000.00 | 238,239,529.00 | -11,239,529.00 |
| ආ. ප්‍රාග්ධන | 145,245,000.00 | 45,124,611.00 | 100,120,389.00 |
| ඇ. ව්‍යාපෘති - දේශීය ප්‍රදාන | - | | |
| ඈ. ව්‍යාපෘති - විදේශ ප්‍රදාන | - | | |
| මුළු ගණන | **372,245,000.00** | **283,364,140.00** | **88,880,860.00** |

**16.** මූල්‍ය තත්ත්වයේ ප්‍රගතිය පිළිබඳ විස්තර (අභ්‍යන්තර ආදායම)

| ආදායම් ප්‍රභවය | ප්‍රතිපාදන / වෙන්කිරීම් ඇස්තමේන්තු - 2016 | ලැබීම් 2015 | අඩු / වැඩි |
|---|---|---|---|
| අ. උපාධි අපේක්ෂක | | 9,867,923.00 | |
| ආ. පශ්චාත් උපාධි | | | |
| ඇ. උපදේශක | | | |
| ඈ. වෙනත් / පාඨමාලා මුදල් | | 14,850,563.00 | |
| මුළු ගණන | | **24,718,486.00** | |

## 17. මූල්‍ය ක්‍රියාකාරීත්ව විශ්ලේෂණය - 2016

| විෂයය | සංකේතය | ඒක ශිෂ්‍ය පිරිවැය |
|---|---|---|
| අ. ඒක ශිෂ්‍ය පිරිවැය පුනරාවර්තන වියදම් | | 583,547.00 |
| ආ. ඒක ශිෂ්‍ය පිරිවැය ප්‍රාග්ධන වියදම් | | 373,380.00 |
| මුළු ගණන | | 956,927.00 |

## 18. යටිතල පහසුකම් සඳහා 2016 තුළ ලැබීම්

| යටිතල පහසුකම් පිළිබඳ විස්තර | ප්‍රතිපාදන | වියදම් | ප්‍රගතිය |
|---|---|---|---|
| වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් | 8,650,000.00 | 8,561,219.00 | 100% |
| ඉදිකිරීම් | 101,000,000.00 | 28,665,567.00 | 30% |
| **මුළු ගණන** | 109,650,000.00 | **37,226,786.00** | |

## 19. වෙනත් විස්තර :

### 19.1 පුස්තකාලය

2016 වර්ෂයේ පොත් ප්‍රතිග්‍රහණය කර ගැනීම

| විස්තරය | වටිනාකම (රු) | පිටපත් ගණන |
|---|---|---|
| **මිල දී ගැනීම්** | 243,928.90 | 427 |
| **පරිත්‍යාග** | 21,757.70 | 53 |
| **එකතුව** | **265,686.60** | **480** |

2016 වර්ෂයේ ශාස්ත්‍රිය වාරික ප්‍රකාශන ප්‍රතිග්‍රහණය කර ගැනීම

| විස්තරය | වටිනාකම (රු) | පිටපත් ගණන |
|---|---|---|
| **මිල දී ගැනීම්** | 12,960.00 | 02 |
| **පරිත්‍යාග** | 2,500.00 | 05 |
| **එකතුව** | **15,460.00** | **07** |

**පර්යේෂණ හා ප්‍රකාශන පිළිබඳ විස්තර**

| **විෂයය** | **ප්‍රකාශිත** |
|---|---|
| පර්යේෂණ ගණන | 02 |
| ලිපි ගණන | 03 |
| වෙනත් :<br>කාර්යය මණ්ඩල පුහුණු පාඨමාලා - 04<br>පොත් හඳුන්වාදීමේ දේශන - 02 | |

**2016 වර්ෂයේ ප්‍රමාද ගාස්තු අයකිරීම්**

| **වර්ෂය** | **මුදල (රුපියල් )** |
|---|---|
| 2016 ජනවාරි - දෙසැම්බර් දක්වා | 39,759.00 |

## 20. මූල්‍ය කටයුතු පිළිබඳ නිසි බලධාරී වාර්තාව

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ දැක්වෙන විධිවිධාන යටතේ කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2016 වර්ෂයට අදාළ මූල්‍ය කටයුතු පිළිබඳ වාර්තාව :

2016 වර්ෂය සඳහා ආයතනයට මහා භාණ්ඩාගාරය විසින් නිදහස් කර ඇති ආධාර මුදල් පහත පරිදි වේ.

<u>පුනරාවර්තන ආධාර</u>

| | | (රුපියල් මිලියන ) |
|---|---|---|
| රජයේ ඇස්තමේන්තු මගින් ලද ආධාර | - | 227.00 |
| අනෙකුත් පුනරාවර්තන ආදායම | - | <u>24.71</u> |
| | | 251.71 |
| <u>එකතු කළා</u> | | |
| ක්‍රමක්ෂය ප්‍රාග්ධන | - | 34.21 |
| මුළු එකතුව (පුනරාවර්තන) | - | <u>285.92</u> |

<u>මූලධන ආධාර</u>

| | | | | | |
|---|---|---|---|---|---|
| වැය ශීර්ෂ | 101 | - | පුනරුත්ථාපන සහ නඩත්තු කටයුතු | - | 8.65 |
| වැය ශීර්ෂ | 102 | - | භාණ්ඩ, උපකරණ, පුස්තකාල පොත් වාර සඟරා, අත්පත් කර ගැනීම් | - | 35.09 |
| වැය ශීර්ෂ | 103 | - | ගොඩනැගිලි ඉදිකිරීම් | - | 101.00 |
| වෙනත් | | | | - | 00.50 |
| මුළු එකතුව (ප්‍රාග්ධන ) | | | | - | 145.24 |
| | | | | | ===== |

**ආදායම**

2016 ගිණුම් වර්ෂය තුළ පුනරාවර්තන ආධාර ලෙස රජයෙන් ලැබුණු මුදල රුපියල් 227,000,000.00 කි.

විද්‍යායතනය මගින් වර්ෂය තුළ දී අනිකුත් පුනරාවර්තන ආදායම් මාර්ග වලින් ලබාගත් මුදල රුපියල් 24,718,186.00 කි.ඒ අනුව මුළු ආදායම රුපියල් 251,718,186.00 කි.

**වියදම**

2016 වර්ෂය සඳහා මුළු පුනරාවර්තන වියදම රුපියල් 238,239,529.00 ක් විය. මේ අනුව වර්ෂයේ ආදායමට වඩා අඩුවෙන් දරා ඇති වියදම රුපියල් 13,478,657.00 කි.

**ස්ථාවර වත්කම් ක්ෂය කිරීම**

ආයතනයේ ස්ථාවර වත්කම් ක්ෂය කිරීම වෙනුවෙන් 2016 වර්ෂය තුළ රුපියල් 34,209,945.00 වෙන්කර ඇත.

**ප්‍රාග්ධන සේවා මූලධන ප්‍රතිඵලය**

**වැය ශීර්ෂ 101 - පුනරුත්ථාපන සහ නඩත්තු කටයුතු**

පුනරුත්ථාපන සහ නඩත්තු වැය ශීර්ෂ (101) සඳහා ලැබුණු ප්‍රතිපාදන මුදල රුපියල් 8,650,000.00 ක් වන අතර එමගින් 2016 වර්ෂය දරා ඇති මුළු වියදම රුපියල් 8,561,219.00 කි.

**වැය ශීර්ෂ 102 - භාණ්ඩ අත්පත් කර ගැනීම**

වත්කම් අත්පත් කර ගැනීමේ වැය ශීර්ෂ (102) සඳහා ලැබුණු ප්‍රතිපාදන මුදල රුපියල් 35,095,000.00 ක් වන අතර ඒ සඳහා දරණ ලද මුළු වියදම රුපියල් 7,897,825.00 කි.

**වැය ශීර්ෂ 103 - ඉදිකිරීම් කටයුතු**

ඉදිකිරීම් වැය ශීර්ෂ (103 ) සඳහා ලැබුණු ප්‍රතිපාදන මුදල රුපියල් 101,000,000.00 ක් වන අතර ඒ සඳහා දරණ ලද මුළු වියදම රුපියල් 28,665,567.00 කි.

**වෙනත් - ප්‍රාග්ධන වියදම්**

වෙනත් ප්‍රාග්ධන වියදම් සඳහා ලැබුණු ප්‍රතිපාදන මුදල රුපියල් 500,000.00 කි.

මහාචාර්ය ජයන්ත වැලිහිඳ

නිසි බලධාරී

## 21. 2016.12.31 දිනට මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශනය

| | 2016 | | 2015 | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| වත්කම් | | | | |
| ජංගම නොවන වත්කම් | | | | |
| ඉඩම්, යන්ත්‍රෝපකරණ හා උපකරණ | 367,482,344 | | 381,184,554 | |
| (i) අස්පෘශ්‍ය වත්කම් | 331,600 | 367,813,944 | 31,600 | 381,516,154 |
| (j) වෙනත් | | 942,157 | | 1,194,657 |
| (k) නිම නොවූ වැඩ | | 110,528,968 | | 81,863,401 |
| (l) මූලධන අත්තිකාරම් | | 27,626,742 | | 28,427,925 |
| ආයෝජන | | | | |
| ස්ථාවර තැන්පත් | | 169,190,684 | | 82,412,633 |
| | | **676,102,495** | | **575,414,770** |
| ජංගම වත්කම් | | | | |
| (a) ගබඩා අත්තිකාරම් -(Sch –C) | 1,644,868 | | 2,018,443 | |
| (b) ණය ගැතියෝ - (Sch –D) | 1,789,230 | | 1,226,130 | |
| (c) ණය සහ අත්තිකාරම් - (Sch –E) | 19,577,692 | | 18,225,291 | |
| (d) මිශ්‍ර අත්තිකාරම් | - | | 8,880 | |
| (e)පර්යේෂණ අත්තිකාරම්-(Sch –F) | - | | - | |
| (f) පෙර ගෙවීම් - (Sch –G) | 99,116 | | 53,735 | |
| (g) බැංකු ශේෂය | 72,180,508 | | 44,432,931 | |
| බැංකු ශේෂය (බාහිර පාඨමාලා) | 16,325,635 | | 14,232,946 | |
| (h) සුළු මුදල් ශේෂය | 180 | | 180 | |
| (i) වෙනත් වත්කම් - (Sch –H) | 2,154,602 | 113,771,831 | 1,899,338 | 82,097,874 |
| මුළු වත්කම් | | **789,874,326** | | **657,512,644** |
| වගකීම් | | | | |
| (a) ජංගම වගකීම් - (Sch –I) | 440,528 | | 535,938 | |
| (b) ගෙවීම් - (Sch –K,L) | 34,485,525 | | 33,075,829 | |
| (c) උපචිත වියදම් - (Sch –M) | 3,109,400 | **38,035,453** | 3,815,425 | **37,427,192** |
| ජංගම නොවන වගකීම් | | | | |
| (a) පාරිතෝෂික දීමනා වෙන්කිරීම්-(Sch –N) | | 53,538,130 | | 45,719,036 |
| මුළු වගකීම් | | **91,573,583** | | **83,146,228** |
| මුළු ශුද්ධ වත්කම් / හිමිකම් | | **698,300,743** | | **574,366,416** |
| | | ========= | | ========= |
| ශුද්ධ වත්කම් / හිමිකම් | | | | |
| (a) වැයකළ ප්‍රාග්ධනය | 361,256,304 | | 345,950,312 | |
| (b) වැය නොකළ ප්‍රාග්ධනය | 204,872,481 | | 104,752,093 | |
| (c) අරමුදල | (36,571,627) | | (44,898,052) | |
| (d) විශේෂ කටයුතු සඳහා වූ ප්‍රදාන | 11,899,523 | | 16,130,959 | |
| (e) වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය | 156,844,062 | | 152,431,104 | |
| | | ----------------- | | ----------------- |
| මුළු ශුද්ධ වත්කම් / හිමිකම් | | **698,300,743** | | **574,366,416** |
| | | ======== | | ========= |

1978 අංක 06 දරණ විශ්වවිද්‍යාල පනත ප්‍රකාරව හා අනෙකුත් ව්‍යවස්ථාපිත නියමයන් ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.

ඩී. පී.විජේරත්න

වැඩබලන නියෝජ්‍ය මූල්‍යාධිකාරී ආයතනයේ කළමණාකරණ මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම දරණ අතර කළමනාකරණ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් කරන ලදී.

මහාචාර්ය ජයන්ත වැලිහිඳ — ආර්.කේ.ජ්. රණවීර

නිසි බලධාරී — කළමනාකරණ මණ්ඩල සාමාජික

## 22. 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශනය

| | 2016 | | 2015 | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| **මෙහෙයුම් ආදායම්** | | | | |
| පුනරාවර්තන ආධාර | | 227,000,000 | | 191,000,000 |
| ක්‍රමක්ෂය | | 34,209,945 | | 36,522,959 |
| **වෙනත් ආදායම්** | | | | |
| (1) ණය සහ අත්තිකාරම් පොලී | 721,353 | | 812,934 | |
| (2) විවිධ ලැබීම් | 432,621 | | 557,510 | |
| (3) පොලී ආදායම | 7,565,587 | | 5,042,177 | |
| (4) ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු | 384,745 | | 279,854 | |
| (5) විභාග ගාස්තු | 26,000 | | 21,600 | |
| (6) පුස්තකාල දඩ මුදල් | 27,282 | | 62,424 | |
| (7) වෛද්‍ය ගාස්තු | - | | 17,770 | |
| (8) දේපල වලින් වූ කුලී ආදායම | 552,124 | | 471,500 | |
| (9) ප්‍රකාශන විකුණුම් | - | | - | |
| (10) රථ වාහන විකුණුම් | - | | - | |
| (11) පැරණි භාණ්ඩ විකුණුම් | 157,911 | | 103 | |
| (12) බාහිර පාඨමාලා ආදායම් | 14,850,563 | | 19,131,874 | |
| | | 24,718,186 | | 26,397,746 |
| | | **285,928,131** | | **253,920,705** |
| **මෙහෙයුම් වියදම්** | | | | |
| (1) පුද්ගල පඩිනඩි | 177,610,851 | | 168,733,041 | |
| (2) ගමන් වියදම් | 1,570,638 | | 243,893 | |
| (3) සැපයීම් | 6,329,846 | | 6,245,948 | |
| (4) නඩත්තු | 2,810,115 | | 2,651,861 | |
| (5) ගිවිසුම්ගත සේවා | 28,114,221 | | 30,459,672 | |
| (6) පර්යේෂණ සහ සංවර්ධන | 155,447 | | - | |
| (7) ක්ෂයවීම් | 34,209,945 | | 36,522,959 | |
| (8) වෙනත් මෙහෙයුම් වියදම් | 7,244,739 | | 6,983,844 | |
| (9) පාඨමාලා වියදම් | 14,403,672 | | 15,604,190 | |
| (10) මුළු මෙහෙයුම් වියදම් | | **272,449,474** | | **267,445,408** |
| **මෙහෙයුම් කටයුතු වලින් ජනිත වූ අතිරික්තය (ඌනතාවය)** | | **13,478,657** | | **(13,524,703)** |
| | | ========= | | ========= |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. එච්ඊඩී/ඊ/ජීඩබ්ජ්අයි/1/16/03 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2017 මැයි 09 දින

නිසි බලධාරී,

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය

**ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1995 අංක 1 දරන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතන නියමාවලියේ 19 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාරව විස්තරාත්මක වාර්තාවක් විද්‍යායතනයේ නිසි බලධාරී වෙත 2017 අප්‍රේල් 20 දින නිකුත් කරන ලදි.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තියෙන් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 48 ඡේදය ප්‍රකාර ගිණුම්කරණ ප්‍රමිතයක් මඟින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටක හැර වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් එකිනෙකට හිලව් නොකළ යුතු වුවත් විද්‍යායතනයේ මහපොළ හා ශිෂ්‍යාධාර ලැබීම් හා ගෙවීම් එකිනෙකට හිලව් කර ශුද්ධ ශේෂය පමණක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 21 වන සියවස සඳහා වූ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය විසින් විද්‍යායතනයේ රසායනාගාරය වැඩි දියුණු කිරීම සඳහා වැය කර තිබූ රු.6,250,000 ක ප්‍රාග්ධන ස්වරූපයේ වියදම ගිණුම්වලින් සම්පූර්ණයෙන් අත්හැරී තිබුණි.

(ආ) භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලැබුණු මුදලින් පුනරාවර්තන ස්වරූපයේ වියදමක් වූ සේවක පුහුණු කටයුතු සඳහා 2014 වර්ෂයේදී වැයකල රු.590,198 ක් අදාල ප්‍රතිපාදනයෙන් කපාහැරීම වෙනුවට දිගින් දිගටම ජංගම නොවන වත්කමක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | මුදල් රෙගුලාසි 756 | පිරිවැය රු.14,209,200 ක්වූ පුස්තකාල පොත් පිළිබඳ විධිමත් සමීක්ෂණයක් සිදු කල යුතු නමුත් 2013 වර්ෂයෙන් පසුව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ආ) | 2000 ජුනි 14 දිනැති අංක 87(i) දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 03 ඡේදය | අතිකාල දීමනා ගෙවීම මාසයකට පැය 20 ට සීමා කළ යුතු බවත් එම සීමාව ඉක්මවීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිශ්චිත අධිකාර බලය ලබා ගත යුතු බව දක්වා ඇතත් 2016 වර්ෂයේ මාස 05 ක අතිකාල පිළිබඳ සිදුකළ නියැදි පරීක්ෂාවේදී කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත පමණක් අනුමත සීමාව ඉක්මවා පැය 6498 ක් සඳහා රු.461,125 ක මුදලක් අතිකාල දීමනා ගෙවා තිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛ 9.3.1 (vii) | විද්‍යායතනයේ අධ්‍යක්ෂ තනතුර පූර්ණ කාලීන තනතුරක් වුවද ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදී සිටින මහාචාර්යවරයෙකු විද්‍යායතනයේ නිසි බලධාරි වශයෙන් අධ්‍යක්ෂ තනතුරෙහි රාජකාරි ආවරණයට මාසිකව රු.180,000 ක ගරු දීමනාවක් මත 2015 මැයි 25 දින පත්කර තිබුණි. මාස තුනෙන් තුනට මෙම නිලධාරියාගේ සේවය දීර්ඝ කරමින් පැවතුණි. තවද නිසි බලධාරි පූර්ණකාලීනව මෙම ආයතනයේ රැඳී නොසිටින බව 2016 ඔක්තෝබර් මාසයේ විද්‍යායතනයෙන් සිදු කල නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විද්‍යායතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.13,478,657 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.13,524,703 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.27,003,360 කින් වර්ධනය වී තිබුණි. වර්ෂයේ වියදම රු.5,004,066 කින් වැඩිවී තිබුණද පුනරාවර්තන ප්‍රදාන ලැබීම් රු.36,000,000 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

ඉකුත් වර්ෂ හතරක සහ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය සලකා බැලීමේදී 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ඌනතාවයක් පෙන්නුම් කර තිබුණත් මෙහෙයුම් කටයුතුවල සේවක පාරිශ්‍රමික හා අනෙකුත් ගැලපීම් කිරීමෙන් පසු අඛණ්ඩව වර්ධනය වන දායකත්වයක් ලැබී තිබූ බව නිරීක්ෂණය විය. 2016 දෙසැම්බර් 31 දිනට එකතු කළ අගය රු.191,089,508 ක් වූ අතර 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයෙහි එකතු කළ අගයේ වටිනාකම රු.මිලියන 8 ක් එනම් සියයට 4.8 කින් වැඩි වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 අධ්‍යයන කාර්යසාධනය

අධ්‍යයන ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනය ලබා දීමේ, දියුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ කාර්යය විද්‍යායතනයේ ප්‍රධාන අරමුණ වන අතර මෙහෙයුම් කටයුතු සම්බන්ධව සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී අනාවරණය වූ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) සිසුන් බඳවා ගැනීම

(i) විද්‍යායතනයේ පවතින සම්පත් අනුව වසරකට සිසුන් 120 දෙනෙකු මෙම විද්‍යායතනයට බඳවා ගැනීමට පහසුකම් තිබුණද 2013/2014 අධ්‍යයන වර්ෂයේදී සිසුන් 85 ක් ද 2014/2015 අධ්‍යයන වර්ෂයේදී සිසුන් 72 ක් හා 2015/2016 අධ්‍යයන වර්ෂයේදී සිසුන් 67 ක් ද වශයෙන් අඩු සිසුන් සංඛ්‍යාවක් විද්‍යායතනයට බඳවා ගෙන තිබුණි.

(ii) විද්‍යායතනය විසින් වසරක් පාසා අඩු ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවා ගැනීම නිසා 2016 වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු.575,413 ක් වැනි ඉහළ අගයක් ගෙන තිබුණි.

(ආ) පර්යේෂණ ආධාර හා උපයෝජනය

----------------------------------------

විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන් විසින් සිදු කරනු ලබන පර්යේෂණ ප්‍රකාශනයට පත් කිරීම මඟින් විශ්වවිද්‍යාලය ඉහළ මට්ටමකට හා ගුණාත්මක තත්ත්වයට ගෙන ඒමත් එම පර්යේෂණ නිබන්ධන ආර්ථික සංවර්ධනය උදෙසා ඉවහල් කර ගැනීමත් ජාතියක් වශයෙන් වැදගත්වනු ඇත.

විද්‍යායතනය සිදු කළ පර්යේෂණ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ ඉදිරිපත් කෙරේ.

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපනය පිළිබඳ ජාතික ආයතනය විසින් ආචාර්ය උපාධිය සඳහා ලබාදුන් පර්යේෂණ ප්‍රදානවලින් සමාලෝචිත වර්ෂය අවසානයට රු.594,046 ක ශේෂයක් ඉතිරිව පැවතුණි. 2009/2010 වර්ෂවල පර්යේෂණ 04 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.3,311,450 ක මුදලක් වෙන්කර තිබූ නමුත් එම පර්යේෂණ 04 ම වර්ෂ 06 කට වැඩි කාලයක් ගත වී ඇතත් මේ දක්වා අවසන්කර නොතිබුණි.

(ii) විද්‍යායතනයේ වාර්ෂික වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂයේ පර්යේෂණ ප්‍රකාශන 73 ක් නිම කර තිබුණු නමුත් ප්‍රකාශන පරිසංවාද සඳහා ඉදිරිපත් කර තිබූ සංඛ්‍යාව 46 ක් විය.

(ඇ) විද්‍යායතනය විශ්වවිද්‍යාලයක තත්ත්වයට උසස් කිරීම හා බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය සියයට 25 කින් වැඩි කිරීම යන ඉලක්කය කරා ළඟාවීමට විද්‍යායතනයට නොහැකි වී නොතිබුණි.

(ඈ) අරමුදල් උපයෝජනය

--------------------------

විශ්වවිද්‍යාලයේ කටයුතු ඵලදායී හා කාර්යක්ෂමව ඉටු කිරීම උදෙසා රජය මඟින් ප්‍රතිපාදන ලබා දී තිබුණි. මෙම ප්‍රතිපාදන උපයෝජනය සම්බන්ධ පහත සඳහන් නිරීක්ෂණ කෙරේ.

(i) විද්‍යායතනය වෙත ලබා දුන් ප්‍රාග්ධන ප්‍රදාන වලින් සැලකිය යුතු ප්‍රමාණයක් අදාල කටයුතු සඳහා උපයෝජනය කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උපයෝජනය නොකල ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකම රු.204,868,277 වූ අතර මෙම තත්ත්වය පසුගිය කාලපරිච්ඡේදය පුරා පැවති බව පහත සටහනින් තහවුරු විය.

| | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| ඉදිරියට ගෙනා වැය නොවූ ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය | 17,981,951 | 36,479,414 | 77,637,499 | 104,747,888 |
| වර්ෂය සඳහා ලැබීම් | 50,650,000 | 114,400,000 | 97,095,500 | 145,245,000 |
| | 68,631,951 | 150,879,414 | 174,732,999 | 249,992,888 |
| වර්ෂය තුල දරන ලද වියදම් | 32,152,537 | 73,241,915 | 69,985,111 | 45,124,611 |
| වර්ෂය අවසානයට වැය නොවූ ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය | 36,479,414 | 77,637,499 | 104,747,888 | 204,868,277 |

(ii) ඉකුත් වර්ෂ 04 තුළ රජය විසින් ප්‍රාග්ධන ප්‍රදානයන් එක් එක් වියදම් ශීර්ෂ වෙනුවෙන් ලබා දී තිබුණ ද සමහර කාර්යයන් ඉටු නොකළ අවස්ථා හා ඌන උපයෝජනය කල අවස්ථා පැවති බව පහත සටහනින් තහවුරු වූ අතර ඒ අනුව ආරම්භ කල ප්‍රාග්ධන ව්‍යාපෘතින් නිම කිරීමට හෝ වත්කම් ප්‍රායෝජනයට ගැනීමට හැකි තත්ත්වයට පත් කිරීමට නොහැකි වී ඇති බවත් මේ හේතුවෙන් රජයේ මුදල් නිශ්ක්‍රියව යොදවා තිබූ බවත් පෙන්නුම් කෙරුණි.

| වැය ශීර්ෂය | පසු ගිය වර්ෂ 04ක ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් | පසු ගිය වර්ෂ 04ක වියදම | වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ඉදිරියට ගෙනා ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය | | | 17,981,951 |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 42,650,000 | 55,690,377 | (13,040,377) |
| ඉගැන්වීම් උපකරණ, ලී බඩු හා පුවත් පත් සඟරා | 106,845,000 | 55,963,171 | 50,881,829 |
| ගොඩනැගිලි ඉදිකිරීම් | 256,395,500 | 108,260,427 | 148,135,073 |
| වෙනත් | 1,500,000 | 590,198 | 909,802 |
| 2016 දෙසැම්බර් 31 දිනට වැය නොකළ ප්‍රාග්ධන මුදල් | | | 204,868,277 |

- මෙසේ රජයෙන් ලබාගත් මුදල් අදාල කාර්ය සඳහා යෙදවීම වෙනුවට ජංගම ගිණුම්වල හා කෙටිකාලීන ආයෝජනවල යොදවා තිබුණි.

- සේවක පුහුණු වැඩසටහන් සඳහා 2014 වර්ෂයේදී රු.1,000,000 ක් භාණ්ඩාගාරයෙන් ලබාගෙන තිබුණු නමුත් එයින් දරා තිබු වියදම් රු.590,198 ක් විය. ඉදිරි පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට හෝ ඉතිරිය භාණ්ඩාගාරය වෙත ප්‍රතිපූර්ණය කිරීමට විද්‍යායතනය කටයුතු කර නොතිබුණි.

- අධ්‍යයන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සඳහා 2014,2015 සහ 2016 වර්ෂවලදී භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රාග්ධන ප්‍රතිපාදනවලින් රු.126,476,734 ක් කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතා මත ඉදිකිරීම් ප්‍රමාද වීම නිසා ඉතිරි වී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට එහි ඉදිකිරීම් ප්‍රගතිය සියයට 35 ක් විය.

(ඇ) ක්‍රීඩා අරමුදල රු.279,780 ක් හා පර්යේෂණ අරමුදල රු.779,825 ක් වර්ෂය පුරාම කිසිදු කාර්යයක් සඳහා උපයෝජනය කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 සැප්තැම්බර් සිට දෙසැම්බර් මාසය දක්වා මිලදී ගෙන තිබු රු.212,730 ක් වටිනා පොත් 384 ක් 2017 මාර්තු 10 දින වන විටත් සිසුන්ගේ පරිශීලනය සඳහා ලබා දීමට කටයුතු සලසා නොතිබුණ අතර එම සියලු පොත් පරිග්‍රහණ ලේඛණයට ඇතුළත් කිරීමට හෝ නොතිබුණි.

(ආ) උපාධි අපේක්ෂක සංවර්ධන වැඩ සටහන යටතේ ආයුර්වේද වෛද්‍ය උපාධි අපේක්ෂකයන්ගෙ පංච කර්ම පුහුණුවීම් කටයුතු සඳහා සහ පරිගණක කටයුතු පිළිබඳ කුසලතා සංවර්ධනය කිරීම සඳහා රු.3,000,000 ක් 2010 ඔක්තෝබර් 18 දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වෙන් කර දී තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට එම ගිණුමේ රු.1,214,142 ක ශේෂයක් පැවති අතර සමාලෝචිත වර්ෂය තුළ පංච කර්ම පුහුණු කටයුතු සඳහා මුදල් වැයකර නොතිබුණි.

4.3 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) උපයන ලද අරමුදල් ගිණුමේ මුදල් ශේෂයන් පරීක්ෂාවේදී වර්ෂය පුරාම අවම වශයෙන් මාසිකව රු.13,266,549 ක පමණ මුදල් ශේෂයක් පවත්වාගෙන ගොස් තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) 2011 දෙසැම්බර් 12 දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය නිලධාරීන් අතර ක්‍රියාත්මක කිරීම සඳහා රු.475,000 ක මුදලක් ලබා දී තිබුණද අදාල කාර්යය සඳහා වැය නොකර 2016 වර්ෂය අවසානයට රු.436,200 ක ශේෂයක් ඌන උපයෝජිතව පැවතුණි.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී විද්‍යායතනයේ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලය 46 ක් වුවද තථ්‍ය අධ්‍යයන කාර්ය මණ්ඩලය 34 ක් විය. ආචාර්යවරු 05 ක් 2016 වර්ෂයේ දී සප්ත වාර්ෂික නිවාඩු ලබා තිබුණු බැවින් අධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි පුරප්පාඩු සඳහා තාවකාලික කථිකාචාර්යවරුන් 14 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

(ආ) විද්‍යායතනයේ නව ඉදිකිරීම්, නඩත්තු කාර්යයන්වලදී ඇස්තමේන්තු සකස් කිරීම, ප්‍රමාණපත්‍ර සැකසීම, බිල්පත් නිර්දේශ කිරීම වැනි විවිධ කාර්යයන් සඳහා වසර ගණනාවක සිට තාවකාලික වැඩ ඉංජිනේරුවරුන්ගේ සේවය විද්‍යායතනය විසින් ලබා ගන්නා නමුත් දැනට අනුමත තනතුරු ලේඛණයේ ඇති වැඩ ඉංජිනේරු තනතුර පිරවීම සඳහා සමාලෝචිත වර්ෂයේ අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 ක්‍රියාකාරී සැලැස්ම

විද්‍යායතනයේ 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ඉටුකර ගැනීමට අපේක්ෂිත ප්‍රධාන ඉලක්ක 04 ක් යටතේ විශේෂ අරමුණු 19 කින් යුක්තව ප්‍රධාන ක්‍රියාකාරකම් 188 ක් ඇතුළත්ව සකස් කළ උපායමාර්ගික කළමනාකරණ සැලැස්මෙහි සමාලෝචිත වර්ෂය තුළ ඉටුකරගත යුතු අරමුණු හා ක්‍රියාකාරකම් පිළිබඳ පැහැදිලි නිරූපනයක් සහිත ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ පුරෝකථනය කළ ආදායම හා සත්‍ය ආදායම පරීක්ෂා කිරීමේදී ආදායම රු.3,749,437 කින් අඩු වී තිබුණු බව නිරීක්ෂණය විය. පසුගිය වර්ෂයේ පවත්වන ලද කායචිකිත්සා ආචාර්ය උපාධි පාඨමාලාව සමාලෝචිත වර්ෂයේ පවත්වා නොතිබීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විද්‍යායතනයේ නිසි බලධාරීවරයාගේ අවධානයට වරින් වර යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) වත්කම් පාලනය | (i) සියලුම වත්කම් ලේඛනගත කර නොතිබුණි. |
| | (ii) පුස්තකාල පොත් භෞතික සමීක්ෂණය සිදු කර නොතිබුණු අතර සියලුම පොත් ලැබුණු වහාම පරිග්‍රහණ ලේඛනවල ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) අයවැය පාලනය | ආදායම හා වියදම නිවැරදිව පුරෝකථනය කර නොතිබුණි. |

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

# ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල.
## GAMPAHA WICKRAMARACHCHI AYURVEDA INSTITUTE
UNIVERSITY OF KELANIYA, YAKKALA.

| | | | | | |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ Director | 033-2222739 | නියෝජ්‍ය ලේඛකාධිකාරි (පාලන) Deputy Registrar (Admin) | 033-2226618 | නියෝජ්‍ය මුල්‍යාධිකාරි Deputy Bursar | 033-2223785 |
| | | ෆැක්ස්/Fax | 033-2226618 | ෆැක්ස්/Fax | 033-2223785 |
| ෆැක්ස් Fax | 033-2222739 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි (විභාග) Senior Assistant Registrar (Exams) | 033-2223784 | සහකාර මුල්‍යාධිකාරි (සැපයුම්) Assistant Bursar (Supplies) | 033-3340105 |
| කාර්යාලය General Office | 033-2222740-2222748 033-3340101 | සහකාර ලේඛකාධිකාරි (ශිෂ්‍ය සේවා) Assistant Registrar (Student affairs) | 033-3340106 | ඊ මේල් E-mail | ayurgmp@sltnet.lk |


මගේ අංකය My Number } ජීඩබ්ඒඅයි/ඒසී7/විගණන - 2016 ඔබගේ අංකය Your Number } එච්ඊ/ඩී/ඊ/ජීඩබ්ඒඅයි/1/16/03 දිනය Date } 2017.10.09

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

<u>ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් එවනු ලැබූ ඔබගේ අංක එච්ඊඩී/ඊ/ජීඩබ්ඒඅයි/1/16/03 දරණ 2017/05/09 දිනැති ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාව හා බැඳේ.

එම වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණ 2017.09.22 දින පැවැති මෙම විද්‍යායතනයේ 249 වන කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී සළකා බැලීමෙන් අනතුරුව පහත පැහැදිලි කිරීම් ඉදිරිපත් කරමි.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------

1.3 විගණකගේ වගකීම

----------------------

1.4 තත්ත්වාගණනය කරන ලද මතය සඳහා පදනම

------------------------------------------------------

2 මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

------------------------------------------

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

---

<u>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති -01</u>

මහපොළ හා ශිෂ්‍යාධාර ලැබීම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ප්‍රමාදවන අවස්ථාවන් තුළදී, ආයතන අරමුදලින් එම මහපොළ හා ශිෂ්‍යාධාර ශිෂ්‍යයන් වෙත ලබාදීම සිදුවේ. එම මුදල් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ප්‍රතිපූරණය කර ගැනීම හේතුවෙන් වෙනම ලෙජර ගිණුමක් පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. කෙසේ වුවද, 2017 වර්ෂයේ සිට විගණන නිරීක්ෂණයෙන් පෙන්වා දී ඇති පරිදි ආදායම් වියදම් ගිණුමට ඇතුළත් කිරීමට කටයුතු කරන බවද දන්වමි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---

(අ) මෙය ජර්නල් අංක 2017/57 මගින් නිවැරදි කිරීමෙන් අනතුරුව නිසි පරිදි ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත.

(ආ) දැනට එම වටිනාකම මානව සම්පත් වත්කමක් ලෙස පොත්වල ගිණුම්ගත කර ඇති අතර එය ක්‍රමක්ෂය පදනම මත ඉවත් කිරීමට කටයුතු යොදා ඇත.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

---

| | | |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 756 | 2008, 2009 සහ 2013 වර්ෂවලදී පුස්තකාල පොත් සමීක්ෂණයක් සිදු කර ඇත. දැනට පුස්තකාලය සතු පොත් සියල්ල සමීක්ෂණයට භාජනය කරමින්, KOHA මෘදුකාංග පද්ධතියට ඇතුළත් කිරීම සිදු වෙමින් පවතින අතර එම කටයුතු අවසන් අදියරෙහි පවතින බව දන්වමි. එය අවසන් වූ වහාම මුදල් රෙගුලාසි 756 අනුව විධිමත් සමීක්ෂණයක් සිදු කරන බව දන්වමි. |
| (ආ) | **2000 ජුනි 14 දිනැති අංක 87(i) දරණ ජාතික අයවැය චක්‍රලේඛයේ 03 ඡේදය** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2002.02.26 දිනැතිව නිකුත් කර ඇති ආයතන චක්‍රලේඛ ලිපි අංක 9/2002 අනුව උසස් අධ්‍යාපන ආයතන ප්‍රධානීන්ගේ ඉල්ලීම් සළකා බලා තෘතියික අධ්‍යාපන හා පුහුණු අමාත්‍යාංශයේ ලේකම් විසින් විශේෂ අවස්ථාවන්හි දී හා විශේෂ සේවාවන්හිදි අතිරේක අතිකාල ගෙවීම් කිරීමට අනුමැතිය දී ඇත.<br><br>ඒ අනුව අතිකාල ගෙවීම් කිරීමේදී ආයතන අයවැය ඇස්තමේන්තුවේ අතිකාල වැය ශීර්ෂයේ 75% සීමාව තුළ අදාළ අතිකාල ගෙවීම් වර්ෂයේදී සිදු කිරීමට කටයුතු කර ඇති බවත්, හුදෙක් අත්‍යවශ්‍ය සේවාවන් සඳහා පමණක් කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත අමතර අතිකාල ගෙවීම් කටයුතු සිදු කර ඇති බව වැඩිදුරටත් දන්වමි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ **9.3.1 (vii)** | අමාත්‍යවරයාගේ බලතල ප්‍රකාරව කාලීන පදනම මත අධ්‍යක්ෂ (නිසි බලධාරී) තනතුර ආවරණය කර ඇත. මෙම කාලපරිච්ඡේදය තුළදී ආයතනයේ කටයුතු නිසිපරිදි පවත්වාගෙන යාමට හැකි වී ඇති බව ද දන්වමි. 2017.09.27 දින සිට නව අධ්‍යක්ෂවරයෙකු බඳවාගෙන ඇති අතර ඒ අනුව පැවැති තත්ත්වය නිරාකරණය වී ඇත. |

**3. මූල්‍ය සමාලෝචනය**

----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

**4. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**4.1 අධ්‍යයන කාර්ය සාධනය**

--------------------------

**(අ) සිසුන් බඳවා ගැනීම**

--------------------

(i), (ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල පදනම් කර ගෙන ලියාපදිංචිය සඳහා සිසුන් මෙම විද්‍යායතනය වෙත යොමු කරනු ලැබේ. මෙම විද්‍යායතනයට වාර්ෂික ව සිසුන් 120ක් බඳවා ගැනීමට පහසුකම් සලසා ඇතත් අවශ්‍ය සිසුන් ප්‍රමාණය ලියාපදිංචිය ලබාදීම සිදු නොවේ. ඒ හේතුවෙන් ඒක ශිෂ්‍ය පිරිවැය වැඩි අගයක් ගෙන ඇති බව දන්වමි.

(ආ) පර්යේෂණ ආධාර හා උපයෝජනය

-----------------------------------

**(i)** මෙම විද්‍යායතනයේ ආචාර්යවරුන්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සාර්ථක කර ගැනීම සඳහා NCAS ආයතනය මගින් හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් මුදල් ප්‍රතිපාදන ලබා දී ඇත. එම ආධාර ලබා පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සිදු කරන ආචාර්යවරුන් අතරින් ආචාර්යවරුන් දෙදෙනෙකු සිය පශ්චාත් උපාධි නිබන්ධන ද භාර දී ඇත. අනෙක් ආචාර්යවරුන් සිය අධ්‍යයන කටයුතුවල අවසන් අදියරට ලඟා වී ඇති බව ද දන්වමි.

**(ii)** මේ සම්බන්ධයෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලය දැණුවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව දන්වමි.

(ඇ) 2016 වර්ෂයේ ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු හා ක්‍රියාකාරකම් ඇතුළත් ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇති අතර, පසු කාලීනව එහි 'මෙම විද්‍යායතනය විශ්වවිද්‍යාලය තත්ත්වයට උසස් කිරීම' යන සංකල්පය ඉවත්ව ගොස් ඇත. එබැවින් මෙහි සඳහන් කර ඇති ඉලක්කයට ලඟාවීමට නොහැකිවිය. මේ වනවිට අදාළ ක්‍රියාකාරී සැලැස්ම අවශ්‍ය පරිදි යාවත්කාලීන කරමින් පවතී.

(ඇ) අරමුදල් උපයෝජනය

------------------------

(i) (ii) ශිෂ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ල , අධ්‍යයන ගොඩනැගිල්ල , පරිපාලන ගොඩනැගිල්ල යන ව්‍යාපෘතීන්වල ඉදිකිරීම් කටයුතු නිමවෙමින් පවතින නමුත් මෙතෙක් අවසන් බිල්පත් ලැබී නොමැති බැවින් ඊට අදාළ මුදල් මෙහි අන්තර්ගතවී ඇත. රුපියල් මිලියන 134 ක් වටිනාකම ඇති පරිපාලන ගොඩනැගිල්ල 2017 වර්ෂය අවසන්වීමට පෙර වැඩ අවසන් කර ආයතනයට භාරදීමට නියමිත බැවින් ඊට අදාළ ගෙවීම් සඳහා වූ මුදල් ද මෙහි ඇතුළත් වේ. එම ගොඩනැගිලිවල ගෙවීම් කටයුතු බොහොමයක් මේ වසර අවසාන වන විට සිදු කිරීමට හැකියාව පවතින බැවින් ඉදිරියේදී මෙම මුදල් උපයෝජනය වනු ඇතැයි අපේක්ෂා කරමි.

(ඈ) බාහිර පාඨමාලා ඉපයීම් වලින් වෙන් කරන ලද ක්‍රීඩා අරමුදල හා පර්යේෂණ අරමුදල අවශ්‍ය අවස්ථාවලදී සිසුන්ගේ හා කාර්ය මණ්ඩලයේ ක්‍රීඩා හා පර්යේෂණ අවශ්‍යතා සඳහා වැය කිරීම සිදු වූ බවත් මෙම වසරේදී එම කටයුතු සිදු නොවූ බවත් දන්වන අතර දැනට අදාළ අරමුදල්වලින් ගෙවීම් කිරීමට අවශ්‍ය සැළසුම් සකස් කොට ඇති බවත් දන්වමි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------

(අ) පරිග්‍රහණ ලේඛනයට ඇතුළත් කර නොමැති පොත් හැකි ඉක්මනින් පරිග්‍රහණ ලේඛනයට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

(ආ) මෙම ව්‍යාපෘතිය යටතේ ලැබී ඇති මුදල් ක්‍රමවත් වැඩපිළිවෙලක් යටතේ ප්‍රයෝජනයට ගැනීම සඳහා අවශ්‍ය දැනුවත් කිරීම් සිදු කර ඇති බව දන්වමි.

4.3 අරමුදල් ඌන උපයෝජනය

------------------------------

(අ) ආයතනයේ උපයන ලද අරමුදල් ගිණුමේ ශේෂය අවශ්‍ය අවස්ථාවලදී ප්‍රයෝජනයට ගැනීමේ අරමුණින් කෙටි කාලීනව ආයෝජනය කර ඇති බව දන්වමි.

(අ) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය නිලධාරීන් අතර ක්‍රියාත්මක කිරීම සඳහා ලැබී ඇති අරමුදල් ප්‍රයෝජනයට ගැනීමට උපදේශකවරුන් ලබා දෙන ලෙස ඉල්ලා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කොට ඇත. එහෙත් දැනට එම දෙපාර්තමේන්තුවෙන් උපදේශකවරුන් ලබා දීමට හැකියාවක් නොමැති බව දන්වා ඇත. ඒ අනුව අවශ්‍යකරන උපදේශකවරුන් ලබා ගැනීමට හැකි වූ පසු අදාළ කටයුතු සිදු කරන බව දන්වමි.

4.4 **කාර්ය මණ්ඩල පරිපාලනය**

---

(අ) අධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමේදී විද්‍යායතනයේ අධ්‍යාපනය හදාරා වර්ෂයක් පාසා බිහිවන උපාධිධාරීන් අතුරින් විශිෂ්ඨ කුසලතා දක්වන විද්‍යායතනයේ සිසුන් අධ්‍යයන කාර්ය මණ්ඩලයට ඇතුළත් කර ගැනීමට හැකිවන පරිදි සහ ඒ සම්බන්ධයෙන් සිසුන්ගේ උනන්දුව වර්ධනය කර ගැනීම සඳහා පුරප්පාඩුව පවතින තනතුරු සියල්ල එකවර පිරවීම සිදු නොකර අවශ්‍යතාවය අනුව එම තනතුරු ක්‍රමානුකූලව පිරවීම සිදු වේ. එසේ ම එම තනතුරු මූලික අවස්ථාවේ තාවකාලික පදනම මත බඳවා ගැනීමට කටයුතු කර ඇති බව ද දන්වමි.

(ආ) විද්‍යායතනය සඳහා ඉංජිනේරුවරයකු බඳවාගැනීම සඳහා පුවත්පත් මගින් දැන්වීම් පළ කරන ලදී. එහෙත් සුදුසු අයෙකු බඳවා ගැනීමට නොහැකි විය. ඒ අනුව නැවත අයදුම්පත් කැඳවීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින බව දන්වමි.

5. **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

---

5.1 **ක්‍රියාකාරී සැලැස්ම**

---

2016 වර්ෂයේ ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු හා ක්‍රියාකාරකම් ඇතුළත් ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇති අතර, මේ වනවිට අදාළ ක්‍රියාකාරී සැලැස්ම අවශ්‍ය පරිදි යාවත්කාලීන කරමින් පවතී.

5.2 **අයවැය ලේඛනමය පාලනය**

---

කාය චිකිත්සා ආචාර්ය උපාධි පාඨමාලාව පැවැත්වීමට අවශ්‍ය අවම සිසුන් ප්‍රමාණය නොසිටීම හේතුවෙන් 2016 වර්ෂයේ දී එකී පාඨමාලාව පැවැත්වීමට නොහැකි විය. ඒ හේතුවෙන් මෙම ඌනතාවය සිදු වී ඇත.

6. **පද්ධති හා පාලනයන්**

---

(අ), (ආ) විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි වත්කම් පාලනය, , අයවැය පාලනය යන කරුණු සම්බන්ධයෙන් පවතින අඩුපාඩු මගහරවා ගෙන නිසි පරිදි පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සළසන බව දන්වමි.

වෛද්‍ය එස්.ඩී.පිලපිටිය
අධ්‍යක්ෂ

පිටපත් -

| | | | | |
|---|---|---|---|---|
| 1. | ලේකම් | - | උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය |
| 2. | සභාපති | - | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව |
| 3. | උපකුලපති | - | කැලණිය විශ්වවිද්‍යාලය |
| 4. | ලේකම් | - | මුදල් අමාත්‍යාංශය |

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය - ශ්‍රී ලංකාව

கம்பஹா விக்ரமாராச்சி ஆயுர்வேத நிறுவகம் - இலங்கை

Gampaha Wickramarachchi Ayurvede Institute - Sri Lanka

gwai.kln.ac.lk